**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1 මුල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් වාහන 04 ක් සම්බන්ධයෙන් පසුගිය වර්ෂයන්ට අදාලව ගෙවූ ආදායම් බලපත්‍ර ගාස්තුව රු.49,800 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) කොටවෙහෙර පරණ පාර කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු. 2,901,810 ක මුදල ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

හිඟ බලපත්‍ර ගාස්තු රු. 19,900 පරීක්ෂා කිරීම සඳහා බලපත්‍ර ගාස්තු ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි.

#### 1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ප්‍රාදේශීය සභා රීති 180 | සභාවේ මුදල්, ගබඩා හා ආදායම් එකතු කිරීම් සම්බන්ධව රාජකාරි කරන නිළධාරින් විසින් ඇප ඉදි කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 (03.01) | සභාව සතු වාහන 20 සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | වසර දෙකකට වැඩි කාලයක සිට පැවත එන රු.38,292 ක තැන්පතු මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.1,207,167 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,209,706 ක පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,416,873 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු, කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, වෙනත් ආදායම් හා වෙනත් ආධාර යන ආදායම් මූලාශ්‍ර සියයට 25 සිට සියයට 540 දක්වා පරාසයක වර්ධනයක් සහ බලපත්‍ර ගාස්තු, දඩ හා වරෙන්තු ගාස්තු යන ආදායම් මූලාශ්‍ර සියයට 01 සිට සියයට 30 දක්වා පරාසයක අඩුවීමක් පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා වියදම්, ප්‍රවාහන සම්බන්ධතා, ආධාර මුදල්, විශ්‍රාම වැටුප් යන ශීර්ෂයන් වල සියයට 01 සිට සියයට 82 දක්වා පරාසයක වර්ධනයක් සහ ගමන් වියදම් හා සැපයුම් හා උපකරණ යන අයිතම සියයට 02 සිට සියයට 30 දක්වා පරාසයක අඩුවීමක් පෙන්නුම් කරයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, සත්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ආදායම් විෂය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයේ තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| කුලී | 1,979,920 | 1,657,802 | 36,548 |
| බලපත්‍ර ගාස්තු | 453,000 | 346,440 | 28,305 |
| දඩ හා වරෙන්තු ගාස්තු | 1,107,000 | 932,014 | 269,708 |
| වෙනත් ආදායම් | 339,000 | 530,393 | 288,144 |

**2.3.2 බලපත්‍ර ගාස්තු**

ලෙජරය අනුව 2016 දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ගාස්තු රු. 28,305 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.3.3 වෙනත් ආදායම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 05 ක් පැවති අතර, 2009 අප්‍රේල් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දුරකථන කුළුණක් සඳහා අවම වශයෙන් රු.20,000 ක් බැගින් රු.100,000 ක මූලික ගාස්තුවක් අයකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට අයවිය යුතු හිඟ පොළ ගාස්තු මුදල වන රු.15,008 ක් අයකර නොතිබුණි.

**2.3.4 මුද්දර ගාස්තු**

2016 ජනවාරි 01 දිනට වූ මුද්දර ගාස්තු වශයෙන් රු.235,144 ක් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවය කල නිලධාරියෙකුගෙන් අයවිය යුතු මුදල් අය කිරීමෙන් පසු ගිණුම්වල ඉතිරිව පවතින රු. 5,336 ක ශේෂය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයට පෙර සිට පැවත එන සේවක ණය ලෙස අයවිය යුතු රු.39,388 ක මුදල අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතුව පවතින වාහන 09 ක් සම්බන්ධයෙන් ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා රු.22,755 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) සභාව සතුව ධාවන තත්ත්වයේ පවතින වාහන 03 ක් සඳහා 2016 වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර, වාහන 01 ක් සඳහා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි.

(ඉ) සභාව විසින් රු.1,743,377 ක් වැයකර 2016 ඔක්තෝම්බර් 27 දින වනවිට පරගහකැලේ ප්‍රජා ශාලාව පිළිසකර තිබුණ ද ,මේ වන තුරු මහජන පරිහරණය සඳහා ලබා දී නොතිබුණි.

(ඊ) සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් කොටස් 52 ක අයිතිය සභාවේ නමට පවරාගෙන නොතිබුණි.

## 3.2 නිශ්කාර්ය ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් 2015 අප්‍රේල් 27 දින සභාවට ලබාදුන් රු.6,009,602 වටිනා ටිපර් රථය ධාවන මට්ටමේ පැවැතිය ද භාවිතා නොකර සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2016 ජනවාරි 12 දින ලැබුණු රු.60,000 ක් වටිනා ජල පෙරනයක් භාවිතා නොකර සභා පරිශ්‍රයේ තබා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 අනුව ප්‍රජාපාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාල සංවිධාන විසින් සිදුකරන ලද මුළු කොන්ත්‍රාත් වල වටිනාකම රු.මිලියන 02 ක් බව දක්වා තිබුණ ද දීප්ති ප්‍රජා මණ්ඩලය විසින් රු.1,928,393 ක් වටිනා වාවින්න කඩකාමර සංකීර්ණය ඉදිකරමින් යන අතරතුරදී රු.1,861,530 ක් වටිනා PSDG ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන තවත් ව්‍යාපෘති 02 ක් එම ප්‍රජා පාදක සංවිධානය වෙතම ලබාදී තිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 13 සිට සියයට 404 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

# 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර ගැනීම<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | චක්‍රලේඛ අනුව වැඩ ඉටු කිරීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම |
| (ඈ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම |